**ශීර්ෂ 143 - පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2014 වර්ෂය**

---

මෙම වාර්තාවේ 1 ඡේදයේ සිට 2 ඡේදය දක්වා අමාත්‍යාංශයේ ගිණුම් පිළිබඳ පොදු තොරතුරු ඇතුළත් කර ඇති අතර 3 ඡේදයේ සිට ශිර්ෂයට අදාල විගණන නිරීක්ෂණ දැක්වේ.

## 1.1 විගණන විෂය පථය

පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2015 ජුනි 01 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

## 2.1 විසර්ජන ගිණුම

### (අ) මුළු ප්‍රතිපාදනය හා වියදම

අමාත්‍යාංශය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 451 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 428 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 23 ක් හෙවත් සියයට 5 ක ප්‍රමාණයක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2014 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 406.38 | 406.24 | 0.14 | 0.03 |
| මුලධන | 44.60 | 22.18 | 22.42 | 50.27 |
| **එකතුව** | **450.98** | **428.42** | **22.56** | **5.00** |

## 2.2 අත්තිකාරම් ගිණුම

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 14301 | 4.00 | 3.21 | 2.30 | 2.65 | 20.00 | 8.10 |

**2.3 පොදු තැන්පත් ගිණුම**

**----------------------**

අමාත්‍යාංශයේ 2014 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුමේ ශේෂ එකතුව රු.මිලියන 0.95 ක් විය.

**2.4 විගණන නිරීක්ෂණය**

**----------------------**

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ දක්වා ඇත.

**3. ශීර්ෂය 143 - පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය**

**-----------------------------------------------------**

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

**------------------------------------------**

අමාත්‍යාංශය විසින් 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඑෆ්අයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව පරිගණක, පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි.

**3.2 විසර්ජන ගිණුම**

**------------------**

**3.2.1 අයවැය විචලනය**

**---------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 02 ක් සඳහා සළසා තිබුණු රු.200,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ආ) වැය විෂයයන් 08 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 10 ක සිට සියයට 98 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**3.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

----------------------------------------------------------------------

විෂය අංක 14301 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 1994 අගෝස්තු 10 දිනැති අංක 96 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන පරිදි සැසඳුම් ප්‍රකාශය ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 1.1.6 ඡේදය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් 2014 අගෝස්තු මාසයේදී ස්ථාන මාරු වී ගිය නිලධාරිනියකගේ ණය ශේෂය මාසික ගිණුම් සාරාංශ මගින් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(ඇ)** ස්ථාන මාරු වී ගිය නිලධාරීන්ගේ හා සේවය අවසන් කර ඇති නිලධාරීන්ගේ ණය ශේෂ, අමාත්‍යාංශයේ සේවයේ නියුතු නිලධාරීන්ගේ ණය ශේෂ උපලේඛනයට ඇතුළත් කර තිබුණි.

**3.4 බේරුම් නොකළ බැරකම්**

---------------------------

අමාත්‍යාංශය විසින් 2014 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම්වල එකතුව රු.13,940,741 ක් වී තිබුණි.

**3.5 අනුකූල නොවීම්**

------------------

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

------------------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
| --- | --- | --- |
| | රු. | |
| **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (i) මුදල් රෙගුලාසි 94 (1) | 13,389,926 | වැය විෂයයන් 05 කට සළසා තිබූ ප්‍රතිපාදනයන් උපයෝජනය කළ පසු ඉතිරිය ඉක්මවා බැරකම්වලට එළඹ තිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ii) | මුදල් රෙගුලාසි 396 (ඇ) | 438,842 | නිකුත් කළ නමුත් ගෙවීම සඳහා බැංකුව වෙත ඉදිරිපත් නොවූ කල් ඉකුත් වූ රු.438,842 ක් වටිනා චෙක්පත් 16 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

**3.6 අවිධිමත් ගනුදෙනු**

--------------------

අමාත්‍යාංශය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

**(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම**

--------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය විසින් රු.461,250 ක් වැය කර පරිගණක 03 ක් මිලදී ගෙන තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මිලදී ගෙන තිබුණු පරිගණක අවපැහැගැන්වී හා මල බැදී තිබුණි. එම පරිගණකවලට ගෙවීම් කිරීම සඳහා අනුමත කළ නිලධාරියා සම්බන්ධයෙන් කිසිදු විනය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. එසේම දෝෂ සහිත පරිගණක සැපයූ ආයතනය අසාධු ලේඛන ගතකර රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 1.2.1 හි (ඇ) මාර්ගෝපදේශය ප්‍රකාරව සුදුසුකම්ලත් උනන්දුවක් දක්වන පාර්ශවයන්ට ප්‍රසම්පාදනයට සහභාගී වීම සඳහා සාධාරණ, සමාන හා උපරිම අවස්ථා ලබාදීමට කටයතු නොකර දෝෂ සහිත පරිගණක ආපසු භාරදී නැවතත් එම ආයතනයෙන්ම පරිගණක ලබා ගෙන තිබුණි.

(ii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.3 (අ) හා (ආ) මාර්ගෝපදේශ ප්‍රකාරව සපයන ලද භාණ්ඩ, භාණ්ඩ භාර ගනු ලබන නිලධාරියා විසින් පිරිවිතරවලට හා වෙනත් එකඟ වූ නියමයන්ට අනුකූල බවට සහතික වීම, මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.11.6 (අ) මාර්ගෝපදේශය ප්‍රකාරව වටිනාකම රු.මිලියන 5 ට අඩු කොන්ත්‍රාත් සඳහා පැහැර හැර ඇති සැපයුම්කරුවන් පිළිබඳ දෙපාර්තමේන්තු දත්ත මූලාශ්‍රයක් ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් පවත්වා ගැනීම කළ යුතු වුවත්, ඉහත පරිගණක භාර ගැනීමේදී සහ නැවත මිලදී ගැනීමේදී එසේ කටයුතු කර නොතිබුණි.

**(ආ) ද්විත්ව ගෙවීම්**

මොණරාගල ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සේවය කරන නිලධාරියකු පාර්ලිමේන්තු කටයුතු ඇමතිතුමියගේ කාර්ය මණ්ඩලයේ කළමනාකරණ සහකාර තනතුරකට පත්කර 2010 අප්‍රේල් 27 දින සිට 2014 මැයි 31 දින දක්වා රු. 1,008,307 ක වැටුප් ගෙවා තිබුණු අතර එම කාල පරිච්ඡේදය සඳහා මොණරාගල ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයෙන්ද වැටුප් ගෙවා තිබුණි.

**3.7 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 08 | 06 | 02 |
| (ii) | තෘතියික මට්ටම | 03 | - | 03 |
| (iii) | ද්විතියික මට්ටම | 37 | 29 | 08 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 19 | 16 | 03 |
| | **එකතුව** | **67** | **51** | **16** |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 16 ක් පිරවීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.